# මහජන ආරක්ෂක අමාත්‍යාංශය

## 2024 වර්ෂය සඳහා සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

1. මහජන ආරක්ෂක අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධිත ආයතනයන් වෙනුවෙන් සැපයුම්කරුවෙකු ලෙස/ කොන්ත්‍රාත්කරුවෙකු ලෙස 2024 වර්ෂය සඳහා ලියාපදිංචි වීම සඳහා ඉදිකිරීම්, අලුත්වැඩියාවන්, භාණ්ඩ හා සේවා සැපයීම සඳහා විදේශීය නිෂ්පාදකයින්, අනුමත නියෝජිතවරුන්, දේශීය නිෂ්පාදකයන්, දේශීය සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් සහ උපදේශක ආයතනයන්ගෙන් මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

   - මහජන ආරක්ෂක අමාත්‍යාංශය
   - ශ්‍රී ලංකා පොලිසිය (පොලිස් විශේෂ කාර්ය බලකාය ඇතුළුව)
   - ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
   - පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
   - අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
   - රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය

**2. අයදුම්පත් ලබා ගැනීම.**

අ. අයදුම්පත් **2023.11.23** දින සිට **2023.12.22** දක්වා පහත සඳහන් වෙබ් අඩවි වලින් බාගත (Download) කළ හැකි ය.

**www.pubsec.gov.lk / www.police.lk / www.drp.gov.lk / www.immigration.gov.lk / www.nddcb.gov.lk / www.ngosecretraiat.gov.lk**

ආ. ලියාපදිංචියට අදාළ ඉල්ලුම්පත් කට්ටලය පහත සඳහන් කොටස්වලින් සමන්විත වේ.

- ප්‍රධාන අයදුම්පත.
- විදේශීය සැපයුම් ආයතනයේ අයදුම්පත.
- උපදෙස් හා කොන්දේසි අඩංගු පත්‍රිකාව.
- විස්තරාත්මක කාණ්ඩ ලැයිස්තුව.

**3. කාණ්ඩ ගාස්තු ගෙවීම.**

අ. දේශීය සැපයුම්කරුවකුගෙන් එක් කාණ්ඩයක් වෙනුවෙන් අය කරනු ලබන ගාස්තුව **ශ්‍රී ලංකා රුපියල් එක්දහස් අටසියයකි (රු.1,800.00).**

ආ. විදේශීය සැපයුම්කරුවකුගෙන් කාණ්ඩයක් වෙනුවෙන් අය කරනු ලබන ගාස්තුව **ඇමරිකානු ඩොලර් දහයකි. (ඇ.ඩො. 10 කි).**

ඇ. මහජන ආරක්ෂක අමාත්‍යාංශ කාර්යාලයට කාණ්ඩ ගාස්තු මුදලින් භාර නොගන්නා බැවින් 2024 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා කාණ්ඩ ගාස්තු ගෙවීම **ලේකම්, මහජන ආරක්ෂක අමාත්‍යාංශය, ලංකා බැංකුව, බත්තරමුල්ල ශාඛාව අංක 7040131 දරණ ගිණුමට** බැර වන පරිදි ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් ගෙවීම් කළ හැකි ය.

ඈ. විදේශීය සැපයුම්කරුවන් සඳහා කාණ්ඩ ගාස්තු ගෙවීම පහත සඳහන් Swift Code භාවිත කර **ලංකා බැංකුව** වෙත ගෙවිය යුතු ය.

| | | |
|---|---|---|
| **Swift අංකය** | - | **BCEYLKLX** |
| **බැංකු අංකය** | - | **7010** |
| **ශාඛා අංකය** | - | **679** |
| **ගිණුම් අංකය** | - | **7040131** |

ඉ. කාණ්ඩ ගාස්තු ගෙවීමේදී ඉදිරිපත් කරන මුදල් තැන්පතු පත්‍රිකාව අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

ඊ. දේශීය සැපයුම්කරුවන් හා විදේශීය සැපයුම්කරුවන් කාණ්ඩ ගාස්තු **2023.11.23** සිට **2023.12.22** දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළ ගෙවා අවසන් කළ යුතු අතර **2023.12.22** දිනට පසුව ගෙවනු ලබන කාණ්ඩ ගාස්තු පිළිබඳව මහජන ආරක්ෂක අමාත්‍යාංශය වග කියනු නොලැබේ.

4. ලියාපදිංචි සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් ඉල්ලා සිටීම සාමාන්‍ය සම්ප්‍රදාය වන අතර, තරඟකාරී මිල ගණන් ලබා ගැනීම සදහා බාහිර සැපයුම්කරුවන් /කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීමේ අයිතිය අමාත්‍යාංශය සතුව ඇත.

5. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් අදාල ලිපි ලේඛණ සමඟ **2023.12.22** දිනට හෝ ඊට පෙර ලැබෙන පරිදි මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2024 දේශීය / විදේශීය"** ලෙස සඳහන් කළ යුතුය.

   ප්‍රධාන ගණකාධිකාරී,
   මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
   17 වන මහල, සුහුරුපාය,
   බත්තරමුල්ල,
   ශ්‍රී ලංකාව.

6. 2024 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් අවසන් තීරණ ගැනීමේ අයිතිය මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් සතුවේ. වැඩිදුර තොරතුරු ගණකාධිකාරී-0112887328 මගින් ලබා ගත හැකිය.

**ලේකම්**
**මහජන ආරක්ෂක අමාත්‍යාංශය**
**14 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.**